# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1678 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 06 /11 /2024 පැය1840

## මාධ්‍ය නිවේදනය

**කොකේන් මත්ද්‍රව්‍ය සමඟ විදේශ ජාතිකයෙකු සහ තවත් සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - ගාල්ල වරාය පොලිස් ස්ථානය.**

2024.11.05 වන දින උදෑසන කාලයේදී ගාල්ල වරාය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත දක්ෂිණ අධිවේගී මාර්ගයේ පින්නදූව පිවිසුම ආසන්නයේදී අක්මීමන පොලිස් ස්ථානයේ නිලධාරීන්ගේ සහාය ඇතිව සිදුකරන ලද වාහන පරීක්ෂාවකදී කොළඹ දෙස සිට පැමිණි **කාර් රථයක් පරීක්ෂා කර ග්‍රෑම් 277 ක් බරැති කොකේන් මත්ද්‍රව්‍ය කරල් 19 ක් අඩංගු පාර්සලයක් සමඟ පුද්ගලයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.**

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24 හා 32 වයස්වල පසුවන තල්පේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෙම සැකකරුවන් සම්බන්ධයෙන් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් විසින් සිදුකල වැඩිදුර විමර්ශනයේදී මෙම මත්ද්‍රව්‍ය කොල්ලුපිටිය ප්‍රදේශයේදී විදේශීය ජාතිකයෙකු විසින් ඉහත සැකකරුවන්ට ලබා දී ඇති බවට අනාවරණය වී ඇත.

ඒ අනුව 2024.11.05 වන දින සවස් කාලයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් විසින් බොරැල්ල පොලිස් වසමේදී මෙම කොකේන් මත්ද්‍රව්‍ය ඉහත සැකකරුවන්ට ලබාදුන් විදේශ ජාතික සැකකරු ග්‍රෑම් 672ක් බැරැති කොකේන් මත්ද්‍රව්‍ය කරල් 40ක්, ඇමරිකානු ඩොලර් 500ක් හා තවත් විදේශීය මුදල් නෝට්ටු කිහිපයක් සමගද, මෙම මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ තවත් සැකකරුවෙකු කොකේන් ග්‍රෑම් 04 මිලිග්‍රෑම් 700ක් සමගද අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් විදේශ ජාතික සැකකරු වයස අවුරුදු 52 ක් වන සියරා ලියෝන් ජාතිකයෙකු වන අතර අනෙක් සැකකරු වයස අවුරුදු 28 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ගාල්ල වරාය පොලිසිය හා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**